# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1789/27 - 2012 දෙසැම්බර් මස 19 වැනි බදාදා - 2012.12.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි අධිකාරය)

මගේ අංකය : 4/3/1 (පත්කිරීම් - අත්පත්).

460 වැනි අධිකාරය මත ඉඩම් අත්කර ගැනීමේ පනතේ 63(2) අ වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් නියෝගය මෙයින් නියම කරමි.

නියෝග අංක 2012/7 - පත් කිරීම.

මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා හම්බන්තොට, පරිපාලන දිස්ත්‍රික්කයේ මහාමාර්ග ව්‍යාපෘති වලට ඉඩම් අත්කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීම පිණිස I උපලේඛනයේ දක්වා ඇති ප්‍රදේශය තුළ II වැනි උපලේඛනයේ දක්වා ඇති නිලධාරියා III වැනි උපලේඛනයේ දක්වා ඇති කාලසීමාව දක්වා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීමේ කාර්ය සඳහා නියමිත නිලධාරියෙකු ලෙස මෙයින් නියම කරනු ලැබේ.

| *I වැනි උපලේඛනය* | *II වැනි උපලේඛනය* | *III වැනි උපලේඛනය* |
|---|---|---|
| *බල ප්‍රදේශය දිස්ත්‍රික්කය* | *නිලධාරියාගේ නම* | *කාලසීමාව* |
| හම්බන්තොට | පී. එම්. විජේවික්‍රම මයා (විශ්‍රාමික - සහකාර ඉඩම් කොමසාරිස්) | 2012.12.10 දින සිට නැවත නියමයක් කරන තුරු |

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2012 දෙසැම්බර් මස 18 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", 1200/6,
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

01 - 125